කාර්යසාධන වාර්තාව

Performance Report

செயல்திறன் அறிக்கை

2021



තාක්ෂණ අමාත්‍යාංශය

தொழில்நுட்ப அமைச்சகம்

Ministry Of Technology

තාක්ෂණ අමාත්‍යාංශය

தொழில்நுட்ப அமைச்சகம்

Ministry Of Technology

වැය ශීර්ෂ අංකය 186

1106-1108, 11 වන මහල, වන් ගෝල් ෆේස්, # 1 ඒ, මැද පාර, කොළඹ 02

1106-1108, 11 வது மாடி, வந் கோல் பேஸ், # 1A சென்டர் வீதி, கொழும்பு 02

Unit 1106-1108, 11th Floor, One Galle Face Tower, # 1A, Centre Road, Colombo 02

ශ්‍රී ලංකාව සඳහා අනාගත ඩිජිටල් ආර්ථිකයක් ස්ථාපිත කිරීමේ ජාතික ඉලක්කය සාක්ෂාත් කර ගනිමු.



තාක්ෂණ අමාත්‍යාංශයේ 2021 වර්ෂයට අදාළ කාර්ය සාධන ප්‍රගති වාර්තාව ඉදිරිපත් කිරීමට හැකිවීම සතුටට කරුණකි.

‘‘සෞභාග්‍යයේ දැක්ම’’ ජාතික ප්‍රතිපත්ති රාමුව තුළ තාක්ෂණය පදනම් කර ගත් සමාජයක් ඇති කිරීම එක් ප්‍රධාන ප්‍රතිපත්තියකි. තාක්ෂණ අමාත්‍යාංශය තම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ශක්තිමත් ආයතන පද්ධතිය මෙහෙයවමින් එකී ජාතික ප්‍රතිපත්තිය සහ ජාතික ඩිජිටල් සංවර්තන සැලසුම් ඉටුකර ගැනීමට ඉතා වැදගත් මෙහෙයක් ඉටු කරයි.

මගේ අමාත්‍යාංශය මගින් විදුලි සංදේශන නියාමන කොමිෂන් සභාව මගින් ආරම්භ කරන ලද ‘‘ගමට සන්නිවේදනය - Connect Sri Lanka ව්‍යාපෘතිය, ITU 2030 න්‍යාය පත්‍රය හා සමගාමීව දීප ව්‍යාප්ත බ්‍රෝඩ්බෑන්ඩ් සම්බන්ධතාව වේගවත් කිරීම සඳහා කර්මාන්තය දිරිමත් කරමින් ග්‍රාමීය සම්බන්ධතා සක්‍රීය කිරීම සඳහා සැලකිය යුතු පියවර ගෙන ඇත.

අමාත්‍යාංශය විසින් කර්මාන්ත ස්වයංක්‍රීයකරණය සඳහා අවශ්‍ය වන අන්තර්ජාලය ආශ්‍රිතව බිහි වූ උපාංග (IoT), සුහුරු නගර ඇතිකිරීම, ඉ-සෞඛ්‍ය, ඉ-රාජ්‍ය, ඉ-වාණිජ්‍යය වැනි අනාගත ඉලෙක්ට්‍රොනික සේවාවලට අනුවර්තනය වීම සඳහා අදාළ 5G තාක්ෂණ සන්නිවේදන පහසුකම් වාණිජකරණය කිරීම සියලු දුරකථන සේවා ක්‍රියාකරුවන්ගේ දායකත්වයෙන් මූලාරම්භ කොට ඇත.

ජාතික ඩිජිටල් රජය සහ ඩිජිටල් ආර්ථිකය කේන්ද්‍ර කරගත් උපායමාර්ගික මුලපිරීම් මෙහෙයවීමේදී, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය ප්‍රධාන මහජන සේවාවන් ශීඝ්‍රයෙන් ස්වයංක්‍රීය වන බව සහතික කිරීම සඳහා විවිධ අංශ හරහා ඩිජිටල් පරිවර්තන මුලපිරීම් ඉදිරියට ගෙන යාමට රාජ්‍ය අංශය අඛණ්ඩව සම්බන්ධ කර ගනී. උසාවි ස්වයංක්‍රීයකරණය, ඩිජිටල් සෞඛ්‍ය සේවා සක්‍රීය කිරීම, පළාත් පාලන සේවා ස්වයංක්‍රීයකරණය සහ ඩිජිටල් හැඳුනුම්පත් මුල පිරීම් වැනි ක්‍රියාත්මක ව්‍යාපෘති නුදුරු අනාගතයේ දී පුරවැසියන්ට ඩිජිටල් සක්‍රීය පොදු සේවාවන් පිරිනැමීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරමින් පවතී.

දිවයිනේ සෑම ප්‍රදේශයකම තාක්ෂණය ව්‍යාප්ත කිරීම සඳහා අමාත්‍යාංශය විසින් බොහෝ මුලපිරීම් ගෙන ඇත. ඩිජිටල් පරිවර්තනය සඳහා තාක්ෂණය භාවිතා කිරීමේදී කලාපීය රාජ්‍ය අංශයේ නියෝජනය සම්බන්ධ කර ගැනීම මෙන්ම කලාපීය තාක්ෂණ ආරම්භකයන්ට (regional tech startups) ගැලපෙන පහසුකම් හා පරිසරය ශක්තිමත් ආධාරක පදනමකින් සවිබල ගැන්වීම කෙරෙහි අවධානය යොමු කරමින් දැනටමත් උතුරු, දකුණු, මධ්‍යම සහ නැඟෙනහිර ප්‍රදේශ හරහා මාර්ග සංදර්ශන (Roadshows) පවත්වා ඇත.

දේශීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ / BPM කර්මාන්තය ඇමෙරිකානු ඩොලර් බිලියන 3 ක අපනයන ඉහළ මට්ටමක් දක්වා සංවර්ධනය කිරීමේ අරමුණින් ශ්‍රී ලංකාව තාක්ෂණික සේවා සහ නවෝත්පාදන සඳහා කේන්ද්‍රස්ථානයක් ලෙස ස්ථානගත කිරීම සඳහා හොඳින් ප්‍රකාශිත උපාය මාර්ගයක් ක්‍රියාත්මක කර ඇත. අමාත්‍යාංශය ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩල සමග සහයෝගී ප්‍රවේශයක් ද ආරම්භ කර ඇති අතර, ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරය සමග සහයෝගයෙන් ඩිජිටල් නෝමැඩ් වැඩසටහන ඇතුළු ක්‍රියාකාරකම් සැලසුම් කර ඇත. ඉදිරියේදී පැවැත්වීමට නියමිත තාක්ෂණ උද්‍යානවලට සමගාමීව මෙම ක්‍රියාකාරකම් ශ්‍රී ලංකාව සඳහා අනාගත ඩිජිටල් ආර්ථිකයක් ස්ථාපිත කිරීමේ ජාතික ඉලක්කය සාක්ෂාත් කර ගැනීම සහතික කිරීම සඳහා සකස් කර ඇත.

වේගවත් ඩිජිටල් පරිවර්තනයකට භාජනය වන අතර, ශක්තිමත් සහ ආරක්ෂිත පාලනයක් සහ ඩිජිටල් පරිසරයක් අත්‍යවශ්‍ය වේ. මෙම අංශයෙන් සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇති අතර පුරවැසි දත්තවල ආරක්ෂාව සහතික කිරීම අරමුණු කරගත් පුද්ගලික දත්ත ආරක්ෂණ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට පෙර ගැසට් කර ඇත.

ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) සහ පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා ඒකීය ඩිජිටල් අනන්‍යතා රාමු ව්‍යාපෘතියේ සැලසුම් අවසන් කර ඇත. පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනත සඳහා යෝජිත සංශෝධන අවසන් කිරීම ද මෙයට ඇතුළත් වේ. යෝජිත හැඳුනුම්පත් වේදිකාව සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය හිමිව තිබේ. හඳුනාගත් බැංකු සහ ටෙලිකොම් සේවාවන් සඳහා විසඳුමේ නියමු ක්‍රියාත්මක කිරීමක් සිදු කෙරේ. කළමනාකරණ උපදේශක ප්‍රසම්පාදනය අවසන් කර ඇති අතර හැඳුනුම්පත් වේදිකාව ක්‍රියාත්මක කිරීමේ ලංසු ලේඛන අවසන් කිරීමේ ක්‍රියාවලියේ යෙදී සිටී.

වසර තුළ අමාත්‍යාංශය අවධානය යොමු කර ඇති තවත් ප්‍රධාන ප්‍රමුඛතාවයක් වන්නේ රටේ සයිබර් ආරක්ෂණ සූදානමයි. මේ සම්බන්ධයෙන්, සයිබර් ආරක්ෂණ ව්‍යවස්ථාදායක රාමුව සකස් කිරීම සඳහා අමාත්‍යාංශය විසින් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇති අතර අදාළ නීති කෙටුම්පත් සම්පාදනය අවසන් කර ඇත.

තාක්ෂණ සේවා සක්‍රීය කිරීම සහ නවෝත්පාදන සඳහා කේන්ද්‍රස්ථානයක් ලෙස ශ්‍රී ලංකාව ස්ථානගත කිරීම සඳහා තාක්ෂණික යටිතල පහසුකම් තවදුරටත් ශක්තිමත් කරමින් තාක්ෂණ උද්‍යාන වේගයෙන් බලගැන්වීම සඳහා රජය විසින් තාක්ෂණ උද්‍යාන සංවර්ධන පෞද්ගලික සමාගම ස්ථාපිත කර ඇත. ගාල්ල, කුරුණෑගල, මහනුවර, නුවරඑළිය සහ හබරණ යන ප්‍රදේශවල තාක්ෂණ උද්‍යාන පිහිටුවීම සඳහා අමාත්‍යාංශය විසින් හඳුනාගෙන ඇති උපාය මාර්ගික ස්ථාන පහෙන් ගාල්ල සහ කුරුණෑගල දිස්ත්‍රික්කවල ඉදිකිරීම් මේ වන විටත් සිදුවෙමින් පවතී. තාක්ෂණික උද්‍යාන සැලසුම් කර ඇත්තේ ශ්‍රී ලංකාව තුළ අද්විතීය වටිනාකම් සහිත පහසුකමක් ස්ථාපිත කිරීම තුළින් ගෝලීය තාක්ෂණ ආයතන ආකර්ෂණය කර ගැනීම සඳහා දළ වශයෙන් වර්ග අඩි මිලියන 1.2 ක නිර්මිත වපසරියක් ඇති වන පරිදිය.

''සෞභාග්‍යයේ දැක්ම'' ජාතික ප්‍රතිපත්තියේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට ජාතික ඩිජිටල් පරිවර්තන උපායමාර්ගය ක්‍රියාවට නැංවීම සඳහා සහයෝගිතාව ලබා දීම සම්බන්ධයෙන් තාක්ෂණ අමාත්‍යාංශයේ සහ එහි විෂය පථයට අයත් ආයතනවල සියලුම නිලධාරීන්ට ස්තූති කිරීමට මම මෙය අවස්ථාවක් කර ගනිමි.

ගෝඨාභය රාජපක්ෂ

ශ්‍රී ලංකා ජනාධිපති



තාක්ෂණ අමාත්‍යාංශ ලේකම්ගේ පණිවිඩය.

'සෞභාග්‍යයේ දැක්ම' ජාතික ප්‍රතිපත්ති රාමුව මත පදනම්ව, ඵලදායී පුරවැසියෙකු, තෘප්තිමත් පවුලක්, විනයගරුක සහ සාධාරණ සමාජයක් යන සිව්වැදෑරුම් ප්‍රතිඵල සාක්ෂාත් කර ගැනීමේ ප්‍රධාන ප්‍රතිපත්ති 10 තුළ තාක්ෂණය පදනම් වූ සමාජයක් නිර්මාණය කිරීම තුළින් සමෘද්ධිමත් ජාතියක් ගොඩනැගීමට දායක වීම අපගේ ප්‍රධාන ප්‍රතිපත්තියකි.

ඉහත ප්‍රතිපත්තිය සාක්ෂාත් කර ගනිමින් අනාගත සුහුරු සමාජයක් සඳහා ඩිජිටල් ආර්ථිකයකින් පෝෂණය වූ ඩිජිටල්කරණයෙන් යුත් අනාගත සුහුරු ශ්‍රී ලංකාවක් බිහිකිරීමේ ජාතික අරමුණ ස්ථාපිත කරන ලද අතර ජාතික ප්‍රමුඛතා සඳහා ජාතික මට්ටමින් මහ පෙන්වීම සහ සම්බන්ධීකරණයෙන් ක්‍රියාත්මක වන ආයතන හඳුනා ගන්නා ලදී. 2020 අංක 2187/27 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය, ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර කණ්ඩායම (CERT), ශ්‍රී ලංකා ටෙලිකොම්, සහ සියලුම තොරතුරු තාක්ෂණ උද්‍යාන ප්‍රධාන ප්‍රමුඛතා ආයතන ලෙස හඳුනාගෙන ඇත. ශක්තිමත් ආයතනික රාමුවක් තුළින් ජාතික ඩිජිටල් සංවර්තන මාර්ග සිතියම මෙහෙයවමින් සමස්ත දිශානතිය සහතික කිරීම සහ ආයතන අතර ශක්තිමත් සහජීවනයක් සහ සංහිඳියාවක් ඇති කිරීම තාක්ෂණ අමාත්‍යාංශයේ කාර්ය භාරය වේ.

රාජ්‍ය මෙහෙයුම් පුරවැසි හිතකාමී බවට පත් කිරීම සඳහා විධිමත් කිරීම සහ ඩිජිටල්කරණය කිරීම එක් ප්‍රධාන මූලපිරීමක් වනු ඇත. ලබන වසරේ සැලසුම් කර ඇති ඩිජිටල් හැඳුනුම්පත මෙම සැලැස්ම යථාර්ථයක් බවට පත් කිරීමේ මූලික විසඳුම ලෙස ක්‍රියා කරනු ඇත. 2024 වර්ෂයේ ළඟා කර ගැනීමට සැලසුම් කර ඇති ඇමෙරිකානු ඩොලර් බිලියන තුනක අපනයන ඉපැයීම සාක්ෂාත් කර ගැනීම සඳහා ආයතනික අංශයට සහ විශේෂයෙන්ම IT/BPM කර්මාන්තයට දිරිගැන්වීම් රැසක් ලබා දී ඇත. දැනටමත් ආරම්භ කර ඇති අනෙකුත් කැපී පෙනෙන ව්‍යාපෘති ලෙස උසාවි ස්වයංක්‍රීයකරණ ව්‍යාපෘතිය, තාක්ෂණ උද්‍යාන ව්‍යාපෘතිය, ගමට සන්නිවේදනය සමග Connect Sri Lanka ව්‍යාපෘතිය, සහ දිවයිනේ පාසල් 10,250 කට ෆයිබර් සන්නිවේදන සම්බන්ධතාවය ලබාදීමේ ව්‍යාපෘතිය දැක්විය හැකිය.

2021 වසර තුළ අමාත්‍යාංශයේ කටයුතු ඉදිරියට ගෙනයාමට ලබා දුන් ක්‍රියාකාරී සහයෝගය වෙනුවෙන් අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයට සහ තාක්ෂණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක දෙපාර්තමේන්තු හා ආයතනවල සියලුම නිලධාරීන්ට මම විශේෂයෙන් ස්තූතිවන්ත වෙමි.

ජයන්ත ද සිල්වා

ලේකම්

තාක්ෂණ අමාත්‍යාංශය

පටුන

01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය 2

1.1 හැඳින්වීම 2

1.2 දැක්ම, මෙහෙවර, අරමුණු 2

1.3 ප්‍රධාන කාර්යයන් 3

1.4 සංවිධාන සටහන 4

1.5 අමාත්‍යාංශය යටතේ පවතින ආයතන 4

1.6 අමාත්‍යාංශය යටතේ පවතින ආයතනගත/ අරමුදල් 6

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේ නම්) 6

02 පරිච්ඡේදය – ප්‍රගතිය හා ඉදිරි දැක්ම 7

03 පරිච්ඡේදය - 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය 22

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය 22

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 24

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය 26

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් 28

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය 29

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය 29

3.7 මු.රෙ. 208 ප්‍රකාරව අමාත්‍යාංශ ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන 30

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය 30

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව** 32

04 පරිච්ඡේදය – කාර්ය සාධන දර්ශක 40

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) 40

05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය 41

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු: 41

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න. 42

06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ 43

06.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 43

06.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟයේ බලපෑම 43

06.3 මානව සම්පත් සංවර්ධනය 43

07 පරිච්ඡේදය – අනුකූලතා වාර්තාව 44

01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

අතිගරු ජනාධිපතිතුමා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2020.11.20 දිනැති අංක 2202/25 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව 2020.11.18 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි තාක්ෂණ අමාත්‍යාංශය පිහිටුවන ලද අතර ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2020.12.11 දිනැති අංක 2205/14 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ආයතනික නෛතික රාමුව සංශෝධනය කර ඇත. 2021.06.03 දිනැති අංක 2230/12 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව නැවත ආයතනික රාමුව සංශෝධනය කර ඇත. එනමුත් භෞතිකව අමාත්‍යාංශය ස්ථාපිත කර ඇත්තේ 2021.07.01 දින සිටය. ඒ අවස්ථාව වන විට නිලධාරීන් කිහිප දෙනෙකු පමණක් තාක්ෂණ අමාත්‍යාංශයට අනුයුක්ත කර තිබුණි.

තාක්ෂණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ආයතන පහත පරිදි වේ.

1. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සහ ඒ යටතේ ඇති ආයතන
2. ශ්‍රී ලංකා තොරතුරු සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය සහ ඒ යටතේ ඇති ආයතන
3. ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය
4. ශ්‍රී ලංකා ටෙලිකොම්, එහි උප සමාගම් සහ ඒ යටතේ ඇති ආයතන
5. පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව

1.2 දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

“ නූතන තාක්ෂණයෙන් බලගැන්වුණු සුභුරු සෞභාග්‍යමත් ජාතියක් "

මෙහෙවර

සමාජමය හා කාර්මික සංවර්තනයක් තුළින් උසස් තාක්ෂණ භාවිතය, නවෝත්පාදනය හා සංවර්ධනය යන ජාතික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය තාක්ෂණ සංවර්ධනයට අදාළ ප්‍රතිපත්ති, උපායමාර්ග, ප්‍රමුඛතා, වැඩසටහන්, සැලසුම් හා මාර්ගෝපදේශ සම්පාදනය හා ප්‍රතිනිර්මාණය කිරීම.

අරමුණු

1. රාජ්‍ය යාන්ත්‍රණය හා වෙළඳපළ ක්ෂේත්‍රයන්හි ක්‍රියාවලිය සරල කරමින් කාර්යක්ෂම හා ජනතා කේන්ද්‍රීය සේවා සැපයීම හා දැනුම් හුවමාරුවේ මෙවලමක් ලෙස තොරතුරු තාක්ෂණය යොදාගනිමින් ඩිජිටල් ආණ්ඩුකරණය පුළුල් කිරීම.
2. දේශාන්තර විද්‍යුත් වාණිජ්‍යය සහ ජාත්‍යන්තර විද්‍යුත් ගෙවීම් ක්‍රම ස්ථාපනය ට පහසුකම් සැලසීම හා විද්‍යුත් ගෙවීම් ක්‍රම ස්ථාපනය දිරිගැන්වීම.

3. රට පුරා විහිදුණු අධිවේගී දත්ත හුවමාරු පද්ධතියක් හා ආශ්‍රිත ජංගම ජාල පද්ධතිය ස්ථාපනය කිරීම.
4. දත්ත ආරක්ෂණය, සයිබර් ආරක්ෂාව, බුද්ධිමය දේපල අයිතිය සඳහා නව නීති හා ආයතනික ව්‍යුහය සකස් කිරීමට දිරිගැන්වීම.
5. පරිසර සංවේදීතාව, තොරතුරු තාක්ෂණය, දැනුම හා නිපුණතා, සෞඛ්‍ය, සංචාරක සේවා හා ක්‍රීඩා ක්ෂේත්‍රවල ශ්‍රී ලංකාවේ සුවිශේෂත්වය මතු කරමින් ඩිජිටල් ආණ්ඩුකරණය හා ආයතනික ව්‍යුහය සඳහා අවශ්‍ය නීති පද්ධතිය හා නියාමක ව්‍යුහය හඳුන්වාදීම.
6. තාක්ෂණ ක්ෂේත්‍රයේ අපනයන දායකත්වය හා ජාතික ආර්ථිකයේ දැනුම හා වෘත්තීය සේවා දායකත්වය පුළුල් වන අයුරින් ව්‍යවසාය සංවර්ධනය, තාක්ෂණික යටිතල පහසුකම් හා ආශ්‍රිත සේවාවන් පුළුල් කිරීම මගින් තාක්ෂණික ව්‍යවසාය සංවර්ධන ආර්ථිකයක් සඳහා පරිවර්තනය කිරීම.
7. තාක්ෂණය කේන්ද්‍ර කරගත්, ආයෝජන, ව්‍යාපාර, ව්‍යවසායකත්වය හා ආශ්‍රිත සේවා කර්මාන්ත සඳහා තාක්ෂණ හා සමාජමය පරිවර්තනයක් (Transition) තුළින් තාරුණ්‍යයට ඉහළ ආදායම් උත්පාදනය කළ හැකි රැකියා නිර්මාණය උදෙසා තාක්ෂණ උද්‍යාන (Technology Parks) ඇති කිරීම.

1.3 ප්‍රධාන කාර්යයන්

I. **"සෞභාග්‍යයේ දැක්ම"** ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා ජනාධිපති කාර්ය සාධක බලකායන්ගේ ද දායකත්වය ලබා ගනිමින් අදාළ අමාත්‍යාංශ හා ආයතන සම්බන්ධීකරණය කරමින් සහ අදාළ අණ-පනත්වලට අනුකූලව ඉහත සඳහන් දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන් අපේක්ෂිත ඉලක්ක කරා මෙහෙයවීම, අධීක්ෂණය හා පසුවිපරම් කිරීම මගින් ජනතා කේන්ද්‍රීය ආර්ථික හා සමාජ සංවර්ධනයක් ඇති කිරීම.

II. අමාත්‍යාංශය යටතේ පවත්නා සංවර්ධන කටයුතු මෙහෙය වීම හා අධීක්ෂණය.

III. පිරිස් කළමණාකරණය හා අමාත්‍යාංශයේ දැක්ම කරා ඔවුන් මෙහෙය වීම.

1.4 සංවිධාන සටහන


ගරු ඇමතිතුමා
ඇමති කාර්ය මණ්ඩලය
සම්බ. ලේකම්
ලේකම්
අතිරේක ලේකම් (පාලන)
අතිරේක ලේකම් (සංවර්ධන)
ප්‍රධාන මූල්‍ය නිලධාරී
ජ්‍යෙ.ස.ලේ.
අධ්‍යක්ෂ
ප්‍රධාන ගණකාධිකාරී
ප්‍රධාන අභ්‍යන්තර
සහකාර ලේකම් (පාලන හා ආයතන)
සහකාර ලේකම් (ප්‍රසම්පාදන)
සහකාර ලේකම් (සැලසුම්)
ගණකාධිකාරී
ගණකාධිකාරී
පරිපාලන නිලධාරී
ස.නි. 4
කළ.ස.නි. 3
කා.කා.ස. 4
ස.නි. 3
කළ.ස.නි. 1
ටියැදුරු 7
ස.නි. 8
කළ.ස.නි. 2
කා.කා.ස. 2
ස.නි. 4
කළ.ස.නි. 2
කා.කා.ස. 2
ස.නි. 1
කළ.ස.නි. 2
කා.කා.ස. 1

1.5 අමාත්‍යාංශය යටතේ පවතින ආයතන

I. ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA)

ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) රජය සතු සමාගමක් ලෙස 2003 මැයි 12 වන දින ස්ථාපිත කරන ලද අතර එය මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ සම්පූර්ණ අධීක්ෂණය යටතේ පවතී.

003 අංක 27 දරන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පනත මගින්, ICTA ව්‍යවස්ථාපිත බලතල සහිතව බල ගැන්වූ අතර, 2008 අංක 33 දරන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (සංශෝධන) පනත මගින් එහි බලතල තවදුරටත් වැඩිදියුණු කරන ලදී. එය ආරම්භයේ සිටම, විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්ගේ අධීක්ෂණයට හා පාලනයට යටත්ව රාජ්‍ය, පෞද්ගලික අංශයේ සහ සිවිල් සමාජයේ මෙන්ම අනෙකුත් සංවර්ධන හවුල්කරුවන්ගේ බහුවිධ පාර්ශවකරුවන් සමඟ වැඩ කරමින් ඩිජිටල් උපාය මාර්ග ක්‍රියාවට නැංවීමේ ප්‍රමුඛයා විය. පනතේ විධිවිධාන පරිදි ICTA ආයතනයේ ප්‍රමුඛ පරමාර්ථයක් වන්නේ රාජ්‍ය අංශයේ, ව්‍යාපාරික අංශයේ හා සිවිල් සමාජයේ ඩිජිටල් සංවර්ධන ක්‍රියාවලීන්ට අවශ්‍ය පහසුකම් සලසමින් බලාත්මක කරමින් මහජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීමට ඉවහල් වන ජාතික ඩිජිටල් සංවර්ධන ප්‍රතිපත්ති හා උපායමාර්ග ක්‍රියාත්මක කිරීමට සහාය වීමයි.

රජය විසින් මූල්‍යයනය කරනු ලබන ICTA ආයතනය වර්තමානයේ තාක්ෂණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක අතර එහි විෂය භාර අමාත්‍යවරයා වන්නේ අතිගරු ජනාධිපතිතුමා ය. 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අනුව එහි 36 (1) ව්‍යවස්ථාවට අනුව 2015 වර්ෂයේ සිට ICTA ආයතනය විගණනය කිරීම විගණකාධිපති වෙත පැවරී ඇත්තේය.

II. විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL)

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, මීට පෙර විදුලි සංදේශ අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය වශයෙන් පැවතුණි.

ප්‍රමුඛ පෙලේ රජයේ ආයතනයක් වන ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ශ්‍රී ලංකාව තුල විදුලි සංදේශ සේවාවන් නියාමනය කිරීමේ ජාතික නියෝජිතායතනය මහජන යහපත ආරක්ෂා කිරීම හා ඉහළ මට්ටමේ තරඟකාරී වෙළඳපොලක් තුල පවතින අභියෝගවලට ප්‍රතිචාරීව විදුලි සංදේශ ක්ෂේත්‍රයේ තිරසාර සංවර්ධනය එමඟින් ප්‍රවර්ධනය කරනු ලැබේ.

III. ශ්‍රී ලංකා ටෙලිකොම් (SLT)

SLTMobitel සමූහය වත්මන් ජාතික තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ (ICT) විසඳුම් සහ ශ්‍රී ලංකාවේ ජාතික ආධාරක ජාලය සපයන්නා වේ. මෙම ආයතනය වසර 160 කට වැඩි කාලයක් ජාතියේ සම්බන්ධතා අවශ්‍යතා ඉටු කර ඇති අතර රට පුරා සැලකිය යුතු ජාල ආයෝජන සිදු කරමින් විදුලි සංදේශ කර්මාන්තය සඳහා නායකත්වය සපයයි. වර්තමානයේ SLTMobitel සමූහය සිය ස්ථාවර සහ ජංගම ආයතන හරහා ලබා දෙන අධිවේගී තන්තු (FTTH) තඹ (Copper) සහ 4G LTE රැහැන් රහිත ප්‍රවේශ ජාල හරහා මිලියන නවයකට අධික පාරිභෝගිකයන් සංඛ්‍යාවකට තම සේවාවන් සපයනු ලැබේ.

පාරිභෝගිකයින්ගේ ඩිජිටල් ජීවන රටාවට ගැලපෙන විවිධ සේවාවන් සහ විසඳුම් සැපයීම සඳහා විදුලි සංදේශ සේවාවලින් ඔබ්බට පුළුල් කිරීම සඳහා ඩිජිටල් සේවා සපයන්නෙකු බවට පරිවර්තනය වීමට ආයතනය අනාගතයේදී අපේක්ෂා කරයි. බහු ජාත්‍යන්තර සබ්මැරීන් කේබල් පද්ධති හරහා ශ්‍රී ලංකාව ලෝකය සමඟ සම්බන්ධ කරමින් ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය ප්‍රධාන ගෝලීය ක්‍රියාකරුවකු ලෙස ස්ථානගත කර ඇත.

IV. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව (DRP)

1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනතේ විධිවිධාන අනුව පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් 1972 වර්ෂයේ සිට වයස අවුරුදු 18 ඉක්මවූ ශ්‍රී ලංකාවේ නීත්‍යානුකූල පදිංචිකරුවන් ලියාපදිංචි කිරීම හා හැඳුනුම්පත් නිකුත් කිරීම ආරම්භ කරන ලදී. අනතුරුව, 2016 අංක

8 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනතේ විධිවිධාන ප්‍රකාරව 2016 ජූලි 07 වන දින සිට පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ වයස් සීමාව අවුරුදු 15 ලෙස සංශෝධනය කරන ලදී.

ආරම්භයේ පටන් කොළඹ 05, කැප්පෙටිපොළ පාර, අංක 38 ලිපිනයෙහි පිහිටුවා තිබූ පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය 2016 සැප්තැම්බර් 26 දින සිට බත්තරමුල්ල, ශ්‍රී සුභූතිපුර පාරේ ‘‘සුහුරුපාය’’ ගොඩනැගිල්ලෙහි ස්ථාපිත කර ඇත.

V. ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය (SLCERT)

ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය 2006 වර්ෂයේදී ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයට අනුබද්ධ ආයතනයක් ලෙස ශ්‍රී ලංකාවේ සයිබර් ආරක්ෂණය සම්බන්ධයෙන් කටයුතු කරන ජාතික ආයතනය ලෙස ස්ථාපනය කරන ලදි. ශ්‍රී ලංකා සර්ට් ආයතනය පිහිටුවීමට පාදක වූ කාරණය වනුයේ ශ්‍රී ලංකාවේ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සිඝ්‍රයෙන් වර්ධනය වීමත් සමග 2018 දී එය ස්වාධීන ආයතනයන් ලෙස සයිබර් ප්‍රහාර මගින් ඇතිවිය හැකි අවදානම අවම කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට ස්ථාපිත කරන ලදි .

ඒ අනුව, සයිබර් ප්‍රහාර වලට සාර්ථකව ප්‍රතිචාර දැක්වීමත්, ඒවාට එරෙහිව පූර්ව ආරක්ෂක පියවර ගැනීම මගින් මහජනතාව, රාජ්‍ය හා පෞද්ගලික ආයතන ආරක්ෂා කිරීමත් ශ්‍රී ලංකා සර්ට් ආයතනය ආයතනයේ මූලික වගකීම වේ.

මෙම ආයතනය සම්පූර්ණයෙන්ම ශ්‍රී ලංකා රජයට අයත් පෞද්ගලික සීමිත වගකීම් සමාගමක් ලෙස ලියාපදිංචි වී ඇති අතර වර්තමානයේ එය තාක්ෂණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

1.6 අමාත්‍යාංශය යටතේ පවතින ආයතනගත/ අරමුදල්

නැත

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේ නම්)

නැත

02 පරිච්ඡේදය – ප්‍රගතිය හා ඉදිරි දැක්ම

ජයග්‍රහණ

තාක්ෂණ අමාත්‍යාංශය පිහිටුවන ලද්දේ 2021 වසරේදී ය. එමගින් රටේ සමස්ත තාක්ෂණ ක්ෂේත්‍රය සංවර්ධනය කිරීමට අපේක්ෂිත විය. අමාත්‍යාංශයට පැවරුණු වගකීම් අතර තොරතුරුතාක්ෂණ හා ඩිජිටල් සංවර්ධනය, තාක්ෂණ ප්‍රතිපත්ති හා ප්‍රමිතීන් සංවර්ධනය, නැනෝ තාක්ෂණය, ජීව තාක්ෂණය, කර්මාන්ත ආශ්‍රිත තාක්ෂණය, සන්නිවේදන තාක්ෂණය හා සයිබර් ආරක්ෂණය වැඩිදියුණු කිරීම ප්‍රධාන කොට පවතී.

ඩිජිටල් සංවර්ධනය, ජාතික සයිබර් ආරක්ෂණය, ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතට කරනු ලැබූ වැඩිදියුණු කිරීම්, දත්ත ආරක්ෂණ පනත් කෙටුම්පතට පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබාගැනීම සහ අනෙකුත් අමාත්‍යාංශයේ විෂය පථය තුළට ගැනෙන විෂයන්ට අදාළව ප්‍රතිපත්ති හා උපායමාර්ග සංවර්ධනය මෙම කාර්‍ය සාධනයට භාජනය වන කාලය තුළ ලබාගත් ජයග්‍රහණ ලෙස දැක්විය හැකිය.

ආරම්භයේදී අමාත්‍යාංශය ICTA ආයතනය තුළ ස්ථාපිත වූ අතර කෙටි කාලයක් තුළ එය වර්තමානයේ පවත්නා ගෝල්ෆේස් වන් ගොඩනැගිල්ලේ ස්ථාපිත කිරීමට හැකි වීම ද ජයග්‍රහණයක් වේ.

කාර්‍ය සාධනයට භාජනය වන කාල පරිච්ඡේදය තුළ අමාත්‍යාංශයේ ප්‍රමුඛතම සංවර්ධන ව්‍යාපෘතියක් වන තාක්ෂණ උද්‍යාන (Techno Parks) පහෙන් හතරක් සඳහා අවශ්‍ය රජයේ ඉඩම් අත්පත්/ පවරා ගැනීමේ කටයුතු නිම කරගැනීමට හැකිවීම සුවිශේෂී ජයග්‍රහණයක් ලෙස පෙන්විය හැකිය. ගාල්ල සහ කුරුණෑගල තාක්ෂණ උද්‍යාන දෙකෙහි මූලික ඉදිකිරීම් කටයුතු මේ වන විටත් ආරම්භ කොට ඇත.

තාක්ෂණ උද්‍යාන (Techno Parks) සංවර්ධනය උදෙසා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියෙන් සහ භාණ්ඩාගාරයේ පූර්ණ අයිතිය යටතේ ‘තාක්ෂණ උද්‍යාන සංවර්ධන පුද්ගලික සමාගම’ (Techno Parks Company Private Limited) ස්ථාපිත කිරීමට හැකි වීම ද ලද ජයග්‍රහණයක් සේ දැක්විය හැකිය.

අභියෝග

අදාළ බලධාරීන්ගෙන් කීප වරක් ඉල්ලා සිටිය ද තවමත් අමාත්‍යාංශයට අනුමත කර ඇති කායී මණ්ඩලය සම්පූර්ණ වී නැත. ජ්‍යෙෂ්ඨ, සහාය සහ කණිෂ්ඨ කායී මන්ඩලයෙන් වැඩි තනතුරු සංඛ්‍යාවක් තවමත් පුරප්පාඩු ව පවතී. මෙම තත්ත්වය මහත් අභියෝගයකි.

අළුතින් පිහිටුවන ලද අමාත්‍යාංශයක් වුව ද තවමත් ඊට අවශ්‍ය උපකරණ, යන්ත්‍ර සූත්‍ර හා වාහන ආදී මූලික යටිතල පහසුකම් ලැබී නොමැත. කායී බොහොමයක් ඉටු කරගනු ලබන්නේ අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවලින් තාවකාලික පදනම මත ලබාගත් සම්පත්වලිනි.

අදාළ කාලය තුළ කායීාල අභ්‍යන්තරය සැකසීමේ ප්‍රසම්පාදනය අවසන් කර ගැනීමට නොහැකි වී ඇත්තේ වෙළඳපල මිල උච්ඡාවචනයන් නිසාවෙනි.

ඉදිරි ඉලක්ක

I. තාක්ෂණය මත පදනම් වන සමාජයක් ගොඩනැංවීම සඳහා ආයතන මෙහෙයවීම සහ සම්බන්ධීකරණය.
II. ජනතා කේන්ද්‍රීය ඩිජිටල් ආණ්ඩු ක්‍රමයක් ඇති කිරීම සඳහා මගපෙන්වීම හා තාක්ෂණික දායකත්වය ලබාදීම.
III. ජාත්‍යන්තර නව නිපැයුම් කේන්ද්‍රස්ථානයක් ඇති කිරීම තාක්ෂණික දායකත්වය ලබාදීම.
IV. ඩිජිටල්කරණය වූ ලංකාවක් ගොඩනැංවීම සඳහා ඉලක්කගත වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීම.
V. තොරතුරු තාක්ෂණ ව්‍යවසායකත්ව සංවර්ධනය තුළින් තාක්ෂණ බද්ධ රැකියා උත්පාදනය, විදේශ විනිමය ඉපයීම් වැඩිදියුණු කිරීම, ශ්‍රී ලංකාව තාක්ෂණ විෂය පදනම් කරගත් ආයෝජන හිතකාමී නව නිර්මාණ හා පර්යේෂණ මධ්‍යස්ථානයක් ලෙස වැඩිදියුණු කිරීම.

I. තාක්ෂණ උද්‍යාන (Techno Parks)

අතිගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ ‘‘සෞභාග්‍යයේ දැක්ම’’ ප්‍රතිපත්ති ප්‍රකාශය පරිදි තාක්ෂණය පදනම් කරගත් සමාජයක් ඇති කිරීම උදෙසා තාක්ෂණ අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කෙරෙන ප්‍රමුඛතම ව්‍යාපෘතියක් ලෙස තාක්ෂණ උද්‍යාන පිහිටුවීම දැනටමත් ආරම්භ කොට ඇත.

ජනතාවගේ ජීවන තත්වය ඉහල දැමීම, සමාජ සහ කර්මාන්ත ක්ෂේත්‍රවල විශාල සංවර්තනයක් සිදුකර තාක්ෂණික නව්‍යකරණ සංස්කෘතියක් බිහිකිරීමේ ජාතික අවශ්‍යතාවය මත විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීම, නව උසස් තාක්ෂණ සමාගම් පිහිටුවීම සහ උත්තේජනය කිරීම, නවෝත්පාදන ප්‍රවර්ධනය කිරීම, අපනයන ප්‍රවර්ධනය කිරීම, දැනුම් හුවමාරු කර ගැනීමට, තරුණ තරුණියන් සඳහා වඩාත් උසස් තාක්ෂණික රැකියා අවස්ථා උත්පාදනය කිරීම සහ විදේශ විනිමය උත්පාදනය මගින් ජාතික ආර්ථික සංවර්ධනයට දායක වීම යන අරමුණු පෙරදැරිව මෙම තාක්ෂණ උද්‍යාන ගොඩනැගීම සිදු කෙරේ.

මෙම තාක්ෂණ උද්‍යාන තුළින් දේශීය හා විදේශීය ප්‍රමුඛ පෙළේ ව්‍යාපාරිකයන්/ ආයෝජකයන් සඳහා ආයෝජන හා ප්‍රවර්ධන අවස්ථා අරමුණු කොට ගෙන පහත සඳහන් පහසුකම් හා සේවා සම්පාදනය කිරීමට අපේක්ෂා කෙරේ.

ගාල්ල තාක්ෂණ උද්‍යානය ස්ථානගත කිරීම සඳහා ඇස්තමේන්තු මුදලක් ලෙස 750Mn ලබා දී ඇත.



ව්‍යාපෘතිය	**ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත කාර්යයන්**	ඇස්ත මේන්තුව (රු.මි.)	**දැනට ක්‍රියාත්මක කර ඇති කාර්යයන්**	ලබාදී ඇති ප්‍රතිපාදන	**භෞතික ප්‍රගතිය (%)**	**මූල්‍ය ප්‍රගතිය**	**වෙනත් සටහන්**
ගාල්ල තාක්ෂණික උද්‍යානය ස්ථාපිත කිරීම.	i. භූමිය හඳුනාගෙන පවරා ගැනීම.	*	i. ගාල්ල වලහංදුව වත්ත භූමිය හඳුනාගෙන, දැනටමත් පවරා ගැනීම් කටයුතු අවසන් කර ඇත.	බැංකු ණය මගින්	MAGA සමාගම විසින් භූමිය පිරිසිදු කිරීමේ කටයුතු ආරම්භ කර ඇත.		තාක්ෂණික උද්‍යානය ඇති කිරීම අමාත්‍ය මණ්ඩල අනුමැතියට අනුව බැංකු ණය ලබාගෙන ක්‍රියාත්මක කෙරේ. පිහිටුවා ඇති තාක්ෂණික උද්‍යාන සංවර්ධන සමාගමේ පරිපාලන වියදම් ඒකාබද්ධ අරමුදලින්දැරීමට අපේෂිතය.
	ii. එහි අවශ්‍ය ගොඩනැගිලි ඉදිකිරීම සඳහා සැලසුම් සකස් කිරීම.		ii. ගාල්ල තාක්ෂණික උද්‍යානය ඉදිකිරීම් සඳහා මේ වන විට ගොඩනැගිලි නිර්මාණය සැලසුම් කරමින් පවතී.				
	iii. ගොඩනැගිලි ඉදිකිරීම සඳහා අවශ්‍ය කොන්ත්‍රාත් කරුවන් හඳුනා ගැනීම හා පැවරීම.		iii. ගාල්ල ඉදි කිරීම් සඳහා මේ වන විට MAGA සමාගම අමාත්‍ය මණ්ඩලය අනුමැතිය පරිදි මේ වන තෝරා ගෙන ඇත.මූලික ඉදි කිරීම් සඳහා සැලසුම් සකස් කරමින් පවතී.				
	iv. භූමිය සකස් කිරීම සහ ගොඩනැගිලි ඉදිකිරීම.						
	v. අවශ්‍ය තාක්ෂණ උද්‍යාන සඳහා කාර්මික තොරතුරු තාක්ෂණ පහසුකම් සැපයීම.						
	vi. තාක්ෂණ උද්‍යාන ස්ථාපිත කිරීම.						

ව්‍යාපෘතිය	**ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත කාර්යයන්**	**ඇස්ත මේන්තුව (රු.මි.)**	**දැනට ක්‍රියාත්මක කර ඇති කාර්යයන්**	**ලබාදී ඇති ප්‍රතිපාදන**	**භෞතික ප්‍රගතිය (%)**	**මූල්‍ය ප්‍රගතිය**	**වෙනත් සටහන්**
කුරුණෑගල තාක්ෂණික උද්‍යානය ස්ථාපිත කිරීම.	i. භූමිය හඳුනාගෙන පවරා ගැනීම.	*	i. කුරුණෑගල රත්ගල්ල, පාළුකුඹල්පොල වත්ත භූමිය හඳුනාගෙන, දැනටමත් පවරා ගැනීම් කටයුතු අවසන් කර ඇත.	බැංකු ණය මගින්	ICC සමාගම විසින් භූමිය පිරිසිදු කිරීමේ කටයුතු ආරම්භ කර ඇත.		තාක්ෂණික උද්‍යානය ඇති කිරීම අමාත්‍ය මණ්ඩල අනුමැතියට අනුව බැංකු ණය ලබාගෙන ක්‍රියාත්මක කෙරේ.පිහිටුවා ඇති තාක්ෂණික උද්‍යාන සංවර්ධන සමාගමේ පරිපාලන වියදම් ඒකාබද්ධ අරමුදලින්දැරීමට අපේක්ෂිතය.
	ii. එහි අවශ්‍ය ගොඩනැගිලි ඉදිකිරීම සඳහා සැලසුම් සකස් කිරීම.		ii. කුරුණෑගල රත්ගල්ල තාක්ෂණික උද්‍යානය ඉදි කිරීම් සඳහා මේ වන විට ගොඩනැගිලි නිර්මාණය සැලසුම් කරමින් පවතී.				
	iii. ගොඩනැගිලි ඉදිකිරීම සඳහා අවශ්‍ය කොන්ත්‍රාත් කරුවන් හඳුනා ගැනීම හා පැවරීම.		iii. කුරුණෑගල රත්ගල්ල ඉදි කිරීම් සඳහා මේ වන විට ICC සමාගම අමාත්‍ය මණ්ඩලය අනුමැතිය පරිදි මේ වන තෝරා ගෙන ඇත. මූලික ඉදි කිරීම් සඳහා සැලසුම් සකස් කරමින් පවතී.				
	iv. භූමිය සකස් කිරීම සහ ගොඩනැගිලි ඉදිකිරීම						
	v. අවශ්‍ය තාක්ෂණ උද්‍යාන සඳහා කාර්මික තොරතුරු තාක්ෂණ පහසුකම් සැපයීම.						

ව්‍යාපෘතිය	**ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත කාර්යයන්**	**ඇස්ත මේන්තුව (රු.මි.)**	**දැනට ක්‍රියාත්මක කර ඇති කාර්යයන්**	**ලබාදී ඇති ප්‍රතිපාදන**	**භෞතික ප්‍රගතිය (%)**	**මූල්‍ය ප්‍රගතිය**	**වෙනත් සටහන්**
	vi. තාක්ෂණ උද්‍යාන ස්ථාපිත කිරීම.						
නුවරඑළිය තාක්ෂණික උද්‍යානය ස්ථාපිත කිරීම.	i. භූමිය හඳුනාගෙන පවරා ගැනීම.	*	i. නුවරඑළිය මහගස්තොට භූමිය හඳුනාගෙන, දැනටමත් පවරා ගැනීම් කටයුතු අවසන් කර ඇත.	බැංකු ණය මගින්	නැත		තාක්ෂණික උද්‍යානය ඇති කිරීම අමාත්‍ය මණ්ඩල අනුමැතියට අනුව බැංකු ණය ලබාගෙන ක්‍රියාත්මක කෙරේ.පිහිටුවා ඇති තාක්ෂණික උද්‍යාන සංවර්ධන සමාගමේ පරිපාලන වියදම් ඒකාබද්ධ අරමුදලින්දැරීමට අපේෂිතය.
	ii. එහි අවශ්‍ය ගොඩනැගිලි ඉදිකිරීම සඳහා සැලසුම් සකස් කිරීම.						
	iii. ගොඩනැගිලි ඉදිකිරීම සඳහා අවශ්‍ය කොන්ත්‍රාත් කරුවන් හඳුනා ගැනීම හා පැවරීම.		ii. නුවරඑළියේ තාක්ෂණික උද්‍යානය ඉදි කිරීම් සඳහා මේ වන විට ගොඩනැගිලි නිර්මාණය සැලසුම් කරමින් පවතී.				
	iv. භූමිය සකස් කිරීම සහ ගොඩනැගිලි ඉදිකිරීම.		iii. නුවරඑළියේ ඉදි කිරීම් සඳහා මේ වන විට Access Engineering සමාගම අමාත්‍ය මණ්ඩලය අනුමැතිය පරිදි මේ වන තෝරා ගෙන ඇත.මූලික ඉදි කිරීම් සඳහා සැලසුම් සකස් කරමින් පවතී.				
	v. අවශ්‍ය තාක්ෂණ උද්‍යාන සඳහා කාර්මික තොරතුරු තාක්ෂණ පහසුකම් සැපයීම.						
	vi. තාක්ෂණ උද්‍යාන ස්ථාපිත කිරීම						

ව්‍යාපෘතිය	**ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත කාර්යයන්**	**ඇස්ත මේන්තුව (රු.මි.)**	**දැනට ක්‍රියාත්මක කර ඇති කාර්යයන්**	**ලබාදී ඇති ප්‍රතිපාදන**	**භෞතික ප්‍රගතිය (%)**	**මූල්‍ය ප්‍රගතිය**	**වෙනත් සටහන්**
මහනුවර තාක්ෂණික උද්‍යානය ස්ථාපිත කිරීම.	i. භූමිය හඳුනාගෙන පවරා ගැනීම.		i. මහනුවර මාඛේරියතැන්න භූමිය හඳුනාගෙන, දැනටමත් පවරා ගැනීම් කටයුතු අවසන් කර ඇත.	බැංකු ණය මගින්	නැත		තාක්ෂණික උද්‍යානය ඇති කිරීම අමාත්‍ය මණ්ඩල අනුමැතියට අනුව බැංකු ණය ලබාගෙන ක්‍රියාත්මක කෙරේ.පිහිටුවා ඇති තාක්ෂණික උද්‍යාන සංවර්ධන සමාගමේ පරිපාලන වියදම් ඒකාබද්ධ අරමුදලින්දැරීමට අපේක්ෂිතය.
	ii. එහි අවශ්‍ය ගොඩනැගිලි ඉදිකිරීම සඳහා සැලසුම් සකස් කිරීම.		ii. මහනුවර මාඛේරියතැන්න භූමියේ ඉදිකිරීම් කටයුතු සඳහා SUNKEN Engineering සමාගම අමාත්‍ය මණ්ඩලය අනුමැතිය පරිදි මේ වන තෝරා ගෙන ඇත. මූලික ඉදි කිරීම් සඳහා සැලසුම් සකස් කරමින් පවතී.				
	iii. ගොඩනැගිලි ඉදිකිරීම සඳහා අවශ්‍ය කොන්ත්‍රාත් කරුවන් හඳුනා ගැනීම හා පැවරීම.						
	iv. භූමිය සකස් කිරීම සහ ගොඩනැගිලි ඉදිකිරීම						
	vi. තාක්ෂණ උද්‍යාන ස්ථාපිත කිරීම						

- *** තාක්ෂණ උද්‍යාන සඳහා ප්‍රාග්ධන වියදම් වශයෙන් රු.බිලියන 50 ක් පමණ වැය වෙතැයි අපේක්ෂිතය**

WORK PROGRAMME – TRACKING (Up to 31st December 2021)

Techno Park – Galle



Techno Park Galle- Master Programme 2nd Edited 26-2-2022-TRACKING

Task Name	Duration	Baseline Start	Baseline Finish	% Complet
DESIGN AND CONSTRUCTION OF TECHNO PARK	**625 days**	**Mon 10/18/21**	**Tue 7/18/23**	**6%**
Project Commencement	1 day	**Mon 10/18/21**	**Mon 10/18/21**	100%
Access Road construction	30 days	Mon 10/18/21	Tue 11/16/21	100%
Internal road widening	60 days	Mon 10/18/21	Thu 12/16/21	85%
Obtain Aprovals (Architect, Client, Engineer)	15 days	Mon 10/18/21	Mon 11/1/21	90%
Site Mobilization and Temporary Works	90 days	Tue 11/2/21	Sun 1/30/22	95%
Drawing Finalization - Architectural/Layout	**92 days**	**Mon 10/18/21**	**Mon 1/17/22**	**93%**
Layout Finalization (Architect)	21 days	Mon 10/18/21	Sun 11/7/21	95%
Amended Layout Finalization (Architect)	27 days	Tue 11/2/21	Sun 11/28/21	74%
Zone -3 (5 nos of Office Buildings	6 days	Mon 11/29/21	Sat 12/4/21	100%
ZONE -2 (4 nos of Office Buildings - A1,A4,A7	15 days	Thu 12/2/21	Thu 12/16/21	100%
ZONE -1 (Admin Building +3 nos of Office	15 days	Sat 12/4/21	Sat 12/18/21	100%
ZONE -4 (CLUB HOUSE)	15 days	Sun 12/19/21	Sun 1/2/22	100%
Drawing Finalization - Structural (Maga)	**125 days**	**Sun 12/5/21**	**Fri 4/8/22**	**85%**
Zone -3 (5 nos of Office Buildings	102 days	Sun 12/5/21	Wed 3/16/22	100%
ZONE -2 (4 nos of Office Buildings - A1,A4,A7	90 days	Fri 12/17/21	Wed 3/16/22	100%
ZONE -1 (Admin Building +3 nos of Office	88 days	Sun 12/19/21	Wed 3/16/22	100%
Drawing Finalization - Structural (Maga)	**125 days**	**Sun 12/5/21**	**Fri 4/8/22**	**85%**
Zone -3 (5 nos of Office Buildings	102 days	Sun 12/5/21	Wed 3/16/22	100%
ZONE -2 (4 nos of Office Buildings - A1,A4,A7	90 days	Fri 12/17/21	Wed 3/16/22	100%
ZONE -1 (Admin Building +3 nos of Office	88 days	Sun 12/19/21	Wed 3/16/22	100%
Basic setting out	10 days	Fri 12/17/21	Sun 12/26/21	90%
Zone -3 (5 nos of Office Buildings	**486 days**	**Mon 12/27/21**	**Wed 5/10/23**	**4%**
Preliminary Works	**23 days**	**Mon 12/27/21**	**Tue 1/18/22**	**26%**
Site clearing (cutting and removing trees)	20 days	Mon 12/27/21	Sat 1/15/22	15%

WORK PROGRAMME – TRACKING (Up to 31st December 2021)

Techno Park – Kurunegala



Task Name	Duration	Start	Finish
Construction of Techno Park Development Project -	**529 days**	**Thu 11/11/21**	**Wed 5/10/23**
Project Commencement - Available Scope	*0 days*	*Thu 11/11/21*	*Thu 11/11/21*
Management Activities	**527 days**	**Thu 11/11/21**	**Mon 5/8/23**
Procurement Activities	**279 days**	**Thu 11/18/21**	**Thu 9/1/22**
Production Activities	**529 days**	**Thu 11/11/21**	**Wed 5/10/23**
Site mobilization	**45 days**	**Thu 11/11/21**	**Sat 12/25/21**
ZONE 1	**366 days**	**Sun 11/21/21**	**Thu 12/1/22**
Zone 1 Commencement	*0 days*	*Sun 11/21/21*	*Sun 11/21/21*
Administration Building	**182 days**	**Mon 11/22/21**	**Tue 5/31/22**
Office building 1	**234 days**	**Thu 12/2/21**	**Mon 8/1/22**

Work Program – Tracking (Up to 31st December 2021)

Techno Park - GalleWork Program – Tracking (Up to 31st December 2021)





Techno Park – Kurunegala



Techno Park – Galle Site Physical Progress of Work as at 31st December 2021

Ongoing construction works and preparing for mobilization



Shared inner space / facility



Techno Park – Kurunegala Site

Physical Progress of work as at 31st December 2021

Preparation works







Completed facility (Inner)





Completed facility (Outer)







II. විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතිය (E-NIC)

සියලුම ශ්‍රී ලාංකික පුරවැසියනට තම අනන්‍යතාවය ඉතාමත් නිවැරදිව හා ඉතා කාර්යක්ෂම ලෙස තහවුරු කල හැකි වන පරිදි අනන්‍ය සම ඩිජිටල් හැඳුනුම්පත් (Sri Lanka Unique Digital Identity) නිකුත් කිරීම සඳහා, යෝජිත වසර 1 ½ ක කාල සීමාවක් තුල වයස අවු 15ට වැඩි සියලුම ශ්‍රී ලංකික පුරවැසියන් මිලියන 16.5කගේ ජීවදත්ත, ජීවමිතික දත්ත ලෙස ඇඟිළි සලකුණු (Finger Print), ඇසෙහි තාරා මණ්ඩලය (Iris) හා ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානයේ ප්‍රමිතියට අනුකූල ඡායාරූපය (International Civil Aviation Organization-ICAO) හා පවුලේ තොරතුරු ඇතුලත් පුද්ගල දත්ත සහිත ජාතික පුද්ගල නාම ලේඛනය (National Persons Registry) ස්ථාපිත කිරීම.

එමඟින්, සියලුම ශ්‍රී ලංකික පුරවැසියන් සඳහා රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවලින් තම අවශ්‍යතා ඉටු කර ගැනීමට හැකි වන පරිදි එම පුද්ගල දත්ත හා තොරතුරු මත පදනම්ව පුද්ගල අනන්‍යතාවය (Identification) නිවැරදිව තහවුරුකිරීම (Authentication), සත්‍යාපනය (Verification) සහ සහතික (Certification) කිරීමේ යාන්ත්‍රණයක් සකස් කිරීම.



Ministry of Technology - Electronic National ID (e-NIC) Project

Annexture 1

Physical and Financial Progress of Development Projects and Programmes as at 31st December, 2021

	Project	Location	Total Cost (Rs.Mn.)		Project period From To (Month/ Year)		Funding Source	Financial Targets and Progress (Rs.Mn.)							Physical Targets and Progress												DPMM Comments
			Original	Current (If revised during implentation	Orginal	Revised (If extended)		Allocation 2021	Financial targets and progress- 2021 (as at 31.12.2021)					Cumulative Expediture (as at 31.12.2021)	Overall physical target (expected outputs) of the project (A)	Cumulative physical progress as at 31st December 2020 as % of (A)	Physical targets and progress - as at 31st December 2021							Cumulative Physical Progress (as at 31.12.2021)	Cumulative Physical Progress (as at 31.12.2021)		Reasons for not achieveing finacial and physical targets / Remarks	
																	Targets					Progress (as at (as at 31.12.2021)						
									Expenditure target	Imprest requested	Imprest Received	Actual Expenditure	Bills in hand				Descriptive target for 2021	Cumulative quarterly targets (%) (B)				Description	as % of (B)		Description	as % of overal target(% of A)		
																		Q-1	Q-2	Q-3	Q-4							
			(4)				(5)	(6)	(7)	(8)	(9)	(10)	(11)	(12)	(13)	(14)	(15)	(16)	(17)	(18)	(19)	(20)	(21)	(22)	(23)	(24)	(25)	
Project																											
1	Electronic National Identity Card Project (e-NIC)	Dept. for Registration of Persons	8,000.69	-	2012-2014	2015-2022	GOSL	**2,996.01**	618.23	260.90	260.90	**285.30**	0.00	**2,610.91**	1. Establishment of a secure, centralized Electronic Storage for registration of Citizens who are of 15 years and above (National Register of Persons)	**79.17%**	1. Complete Restructuring of Department for Registration of Persons (DRP) inline with e-NIC Operations	1.50	3.00	5.00	8.00	1. Process of restucturing of DRP to commence enrolment has been comenced.	**16.63%**	84.17%		**80.50%**	**It has been proposed by ICTA to commence Data Capturing program, of 16.5 million citizens, in 4th Quarter 2022 after the completion of Software development and Hardware infrastructure requirements are completed. Balance Activities assigned to e-NIC Project can only be commenced in 3rd - 4th Quarters of 2022, after the completion of the activites of ICTA.**	
															2. Issuance of Electronic National Identity Card		2. Establishment /Maintenance of DS-DRP Units at 335 Divisional Secretariats and PC-DRP Units at Provincial Level for e.NIC Operations					2.Construction of Provincial Office in Central Province has been commenced and is in progress. VPN connetion provided to all DS-DRP units and Provincial Offices.			2. 335 DS- DRP units and PC- DRP units established in Northern, Eastern, North Western and Southern provinces			
															3. Establishment of Data Sharing and rectification of Citizen data		3. Establishment of Disaster Recovery Data Centre (DRDC) for smooth functioning of e-NIC Operations					3. Discussions are being held with ICTA in this regard						
															4. Facilitation for the National Security and Country Development		4. Establishment & Development of Supportive Infrastructure for Main Data Center at DRP Head Office					4. Discussions are being held with ICTA in this regard						
																	5. Development of IT Infrastructure Facilities at DRP Head Office, DS-DRP Units, PC-DRP Units and Data Centers					5. Procurement of eNIC Software, Procurement of Hardware for Main Data Center and Fingerprint Machines, Laptops and Document Scanners have been commenced and are in progress.			5. Computers, Scanners, Printers and NetworkInfrastructure have already been supplied and established			
																	6. Conduct islanwide data capturing program to get Biographic, Biometric and ICAO Standard Photograph of every eligible Citizen of Sri Lanka					6. Data capturing program is to be commenced in 4th Quarter 2022						
																	7. Establishment of National Persons Register (NPR)					7. Expected to be commenced in 4th Quarter 2022						
																	8. Issuance of e-NIC					8. Expected to be commenced in 4th Quarter 2022						

පිටු අංක ..... සිට ..... දැක්වෙන ඉහත ඉදිරිපත් කෙරෙන තොරතුරු සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

.....	.....
ප්‍රධාන ගණන් දීමේ නිලධාරී	ආයතන ප්‍රධානියා.
නම :	නම :
තනතුර :	තනතුර :
දිනය :	දිනය :

03 පරිච්ඡේදය - 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ -එෆ්

2021.12.31 දිනෙන් අවසන් වූ කාල සීමාව සඳහා වන

මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

රු.

අයවැය (වර්තමාන වර්ෂය)		සටහන	තත්‍ය වර්තමාන වර්ෂය	ඉකුත් වර්ෂය	
-	**ආදායම් ලැබීම්**		14,703,107,307	-	
-	ආදාම් බදු	**1**		-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	**2**	14,702,641,869	-	**ඒසීඒ -1**
-	අන්තර්ජාතික වෙළඳාම මත බදු	**3**		-	
-	බදු නොවන ආදායම් සහ වෙනත්	**4**	465,438	-	
-	**මුළු ආදයම් ලැබීම් (අ)**		14,703,107,307	-	
-	**ආදයම් නොවන ලැබීම්**		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		3,065,150,000	-	**ඒසීඒ -3**
-	තැන්පතු		60,620	-	**ඒසීඒ -4**
-	අත්තිකාරම් ගිණුම්		149,554	-	**ඒසීඒ - 5/5(අ)**
-	වෙනත් ලැබීම්		-	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**3,065,360,174**	-	
-	**මුළු ආදායම් ලැබීම් හා ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**17,768,467,481**	-	
	අඩු කළා: වියදම				
-	**පුනරාවර්තන වියදම්**			-	

-	වේතන, වැටුප් සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	**5**	**10,860,605**	-	
-	අනෙකුත් භාණ්ඩ හා සේවා	**6**	32,367,929	-	**ඒසීඒ - 2(II)**
-	සහනාධාර, සහනාධාර ප්‍රදාන සහ මාරු කිරීම්	**7**	973,052,606	-	
-	පොළී ගෙවීම්	**8**	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	**9**	-	-	
-	**මුළු පුනරාවර්තන වියදම් (ඇ)**		**1,016,281,139**	-	
	මූලධන වියදම්				
-	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම්	**10**	-	-	
	මූලධන වත්කම් අත්පත් කර ගැනීම	**11**	705,679,440	-	
-	ප්‍රාග්ධන පැවරීම්	**12**	1,613,453,212	-	**ඒසීඒ - 2(II)**
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	**13**	-	-	
-	හැකියා වර්ධනය	**14**	-	-	
-	වෙනත් මූලධන වියදම්	**15**	332,711,456	-	
-	**මුළු මූලධන වියදම් (ඉ)**		**2,651,844,108**	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)		-	-	
	තැන්පතු ගෙවීම්		32,520	-	**ඒසීඒ -4**
	අත්තිකාරම් ගෙවීම්		2,184,455	-	**ඒසීඒ - 5/5(අ)**
	මුළු වියදම උ = (ඇ+ඉ+ඊ)		3,670,342,222	-	
-	**2021දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ = (ඇ-උ)**		14,098,125,259	-	

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ -

2021 දෙසැම්බර් 31 දිනට

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

		තත්‍ය	
	සටහන	වර්තමාන වර්ෂය	ඉකුත් වර්ෂය
	-	රු.	රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	**ඒසීඒ -6**	705,635,240.00	-
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	**ඒසීඒ -5/5(අ)**	2,034,901.00	-
මුදල් හා මුදල් සමාන දෑ	**ඒසීඒ -3**	-	-
මුළු වත්කම්		**707,670,141.00**	**-**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
ශුද්ධ වත්කම්		707,642,041	-
දේපළ, පිරියත හා උපකරණ සංචිතය		-	-
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒසීඒ -5(ආ)**		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	**ඒසීඒ -4**	28,100.00	-
අග්‍රිම ශේෂය	**ඒසීඒ -3**	-	-
මුළු වගකීම්		**707,670,141.00**	**-**

පිටු අංක 23.. සිට 24... දැක්වෙන ඉහත ඒසීඒ 1 සිට ඒසීඒ 6 දක්වා වූ අකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක .23.. සිට ..28... දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ.මෙම මූල්‍ය ප්‍රකාශනයන් හි සටහන් මඟින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීමකර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

.....

ප්‍රධාන ගණන් දීමේ නිලධාරී
නම :
තනතුර :
දිනය :

Jayantha De Silva
Secretary of Technology
1106 - 1108 - 11th Floor,
One Galle Face Tower #1A
Centre Road, Colombo

.....

ප්‍රධන මූල්‍ය නිලධාරී/ ප්‍රධාන ගණකාධිකාරී/
නම :
තනතුර :
දිනය :

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාල වර්ෂය සඳහා වන මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

	තත්‍ය වර්තමාන වර්ෂය රු.	ඉකුත් වර්ෂය රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		-
මුළු බදු ලැබීම්	14,702,641,869	-
ගාස්තු, අධිහාර, දඩ මුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	465,438	-
ආදයම් නොවන ලැබීම්		
වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතුකරන ලද ආදායම්		
අග්‍රිම ලැබීම්	3,065,150,000	-
අත්තිකාරම් අය කර ගැනීම්	149,554.00	
තැන්පතු ලැබීම්	60,620.00	
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (අ)	**17,768,467,481** -	-
අඩු කළා - මුදල් වැය කිරීම්:		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	33,635,563	-
සහනාධාර සහ මාරු කිරීම් වියදම්	674,223,506	-
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	93,500,000	
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	14,702,641,869	-
අත්තිකාරම් ගෙවීම්	1,400,371	
තැන්පතු ගෙවීම්	32520	
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**15,505,433,828** -	-

මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**2,263,033,653** **-**	**-**
<u>ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
පොළී	-	-
ලාභාංශ	-	-
භිමිකම් ඉවත් වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම උපණය අය කර ගැනීම	-	-
අත්තිකාරම් අය කර ගැනීම	-	-
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	**-**	**-**
<u>අඩු කළා - මුදල් වැය කිරීම්:</u>		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම්	2,263,033,653	-
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**2,263,033,653**	**-**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	(2,263,033,653)	-
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**(0)**	**-**
<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
තැන්පතු ලැබීම්		
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**-**	**-**
<u>අඩු කළා - මුදල් වැය කිරීම්:</u>		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
තැන්පතු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**-**	**-**

මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(උ)-(එ)	**-**	**-**
මුදල්වල ශුද්ධ වෙනස් වීම් (ඔ) = (උ) -(ඒ)	**(0)**	**-**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**-**	**-**
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**0**	**-**

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

<u>වාර්තාකිරීමේ පදනම</u>

1	<u>වාර්තාකරණ කාලපරිච්ඡේදය</u> 2021 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.
2	<u>මිනුම්කරණ පදනම</u> මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි. මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත
3	<u>ආදායම් හඳුනාගැනීම</u> හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.
4	<u>දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම</u> වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ. දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.
5	<u>දේපළ, පිරියත හා උපකරණ සංචිතය</u> මෙම සංචිත ගිණුම් දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම් වේ.
6	<u>මුදල් හා මුදල් සමාන දෑ</u> 2021 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.
7	

	<u>මූල්‍ය ප්‍රකාශන ආකෘතියෙහි සිදුකරන ලද වෙනස්කම් හා පෙර වර්ෂයේ සංසන්දනාත්මක අගයන් නැවත ගැලපීම.</u> 2021 වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශන ආකෘතිවල සිදුකරන ලද වෙනස්කම් අනුව 2020 වසර සඳහා වන සංසන්දනාත්මක සංඛ්‍යාවල අදාළ ගැලපුම් සිදුකර ඇත.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු. ,000

ආදයම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
1000.11.00	විදුලි සංදේශ බද්ද	-	-	12,839,836,731.82	
1002.14.00	ජංගම දුරකථන සන්නිවේදන කුළුණු බද්ද	-	-	1,432,520,833.68	
002.15.00	කෙටි වෙළඳ පණිවිඩ බද්ද	-	-	430,294,303.50	

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු. ,000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	1,006,315,000	1,089,190,440	1,016,281,139.44	
ප්‍රාග්ධන	8,371,890,000	8,371,890,000	2,651,844107.95	

3.7 මු.රෙ. 208 ප්‍රකාරව අමාත්‍යාංශ ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. ,000

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනය අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
	නැත. අදාළ නොවේ.					

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. ,000

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2019 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2019 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්				
9152	යන්ත්‍රෝපකරණ				
9153	ඉඩම්	56,352,400	5,635,240.00		100%
9154	අස්පෘශ්‍ය වත්කම්				
9155	ජීව විද්‍යාත්මක වත්කම්				
9160	කෙරීගෙන යන වැඩ	-	700,000,000.00		100%
9180	බදු දෙන ලද වත්කම්				

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව**

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } IMT/C/MOT/FA/2021/1 මගේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2022 මැයි 31 දින

අධ්‍යක්ෂ ජනරාල්,

රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

තාක්ෂණ අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

යටෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

එච්.එම්.යූ.එස්.ඒ. විජේකෝන්

සහකාර විගණකාධිපති

විගණකාධිපති වෙනුවට

පිටපත :- ප්‍රධාන ගණන්දීමේ නිලධාරි, තාක්ෂණ අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306 72, பொலதுவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එසිඑමවි/සී/එම්ඩබ්/එන්ඒ/2021/ | ඔබේ අංකය / உமது இல. / Your No. } | දිනය / திகதி / Date } 2022 මැයි 31 දින

අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය මිණුම් දෙපාර්තමේන්තුව

තාක්ෂණ අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

තාක්ෂණ අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව තාක්ෂණ අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට තාක්ෂණ අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම්, විගණකගේ වගකීම් යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.3 මූල්‍ය ප්‍රකාශන පවබඳ්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් නිසුවිකරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම් වේ.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 **මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උපස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම් මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම් හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, වේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල වපුහය සහ අන්තර්ගතය සඳහා පැහැදිලි ලු ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව පැහැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල වපුහය හා අන්තර්ගතය සඳහා පාදක ලු ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අහයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) 2020නොවැම්බර් 20 වන දිනැති අංක 2202/25 දරණ අති විශේෂ ගැසට් පත්‍රය අනුව 2020 නොවැම්බර් මස 18 දින සිට ක්‍රියාත්මක පරිදි පිහිටුවා තිබූ නව අමාත්‍යාංශයක් හෙයින් ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් නොවුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

1.6.1.1 ආදායම් ලැබීම්

(අ) මු.රෙ 85 පරිදි මූලික ඇස්තමේන්තු හා සංශෝධිත ඇස්තමේන්තු සකස් කර නොතිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 50 (ii) ප්‍රකාරව ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන් නිවැරදිව පිළියෙල කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ වගකීම වුවත් ඒ අනුව කටයුතු නොකිරීම නිසා වැය විෂ්තරයන් 10 ක් සඳහා වෙන්කර තිබූ එකතුව රු.මී 60 ක් වූ මුළු ප්‍රතිපාදනයම් ඉතිරිවී තිබුණි.

(ඇ) වැය විෂයන් 09 ක් සඳහා වෙන්කර තිබූ එකතුව රු. 195,915,000ක් වූ ප්‍රතිපාදනයෙන් සියයට 5 සිට සියයට 99 දක්වා පරාසය තුළ එකතුව රු. 180,209,037 ඉතිරිවීම් තිබූ අවස්ථා නිරීක්ෂණය විය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

(අ) සමාලෝචිත වර්ෂයේ ගෘහභාණ්ඩ හා කාර්යාලීය උපකරණ අමාත්‍යාංශ පොත් අනුව රු.150,000,000 ක් ලෙස දක්වා තිබූ නමුත් භාණ්ඩාගාරයේ පොත් අනුව (ගිණුම් ප්‍රකාශ

අංක 10) එහි අගය රු.40,000,000 ක් විය. එනම් රු.110,000,000 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ රාජ්‍ය නොවන ආයතන සඳහා ප්‍රාග්ධන ප්‍රදානයන් අමාත්‍යාංශ පොත් අනුව රු.4,370,480,000 ක් ලෙස දක්වා තිබූ නමුත් භාණ්ඩාගාරයේ පොත් අනුව (ගිණුම් ප්‍රකාශ අංක 10) එහි අගය රු.4,480,480,000 ක් විය. එනම් රු.(110,000,000)ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) වර්ෂයේ රාජ්‍ය නොවන ආයතන සඳහා ප්‍රාග්ධන ප්‍රදානයන් අමාත්‍යාංශ පොත් අනුව රු.510,000,000 ක් ලෙස දක්වා තිබූ නමුත් භාණ්ඩාගාරයේ පොත් අනුව (ගිණුම් ප්‍රකාශ අංක 12) එහි අගය රු.400,000,000 ක් විය. එනම් රු.(110,000,000)ක වෙනසක් පැවතුණි.

2.2 සීමා ඉක්මවීම්

මු.රෙ 506 (ඩී) ප්‍රකාර රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම අමාත්‍යාංශ පොත් වලට අනුව වියදම් උපරිම සීමාව, අවම ලැබීම් සීමාව හා උපරිම හර ශේෂ සීමාව පිළිවෙලින් රු.60,000,000, රු, 140,000 ක් හා රු.2,500,000 ක් ලෙස සංශෝධනය වී තිබුණද භාණ්ඩාගාර පොත් අනුව එහි අගය පිළිවෙළින් රු.60,000,000, රු. 25,000,000 ක් හා රු.100,000,000 ක් ලෙසට දක්වා තිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 වත්කම් කළමනාකරණය

අමාත්‍යාංශය පවත්වාගෙන යාම සඳහා වෙන්කරගෙන තිබූ වර්ග අඩි 7512 ක ප්‍රමාණයෙන් වර්ග අඩි 2300 ක් (කාමර අංක 1105 ට අයත්) විගණිත දිනය වූ 2022 මාර්තු 11 වන විටත් කාර්යාලීය කටයුතු සිදු කිරීමට හැකිවන ආකාරයට වැඩිදියුණු කිරීමක් (Partition) සිදු නොකර කුලියට ගෙන මාස 06 කට ආසන්න කාලයක් ඌන උපයෝජිතව පවතින බව නිරීක්ෂණය විය.

3.2 කළමනාකරණ දුර්වලතා

(අ) අමාත්‍යාංශය පවත්වාගෙන යාම සඳහා කාර්යාල පරිශ්‍රයක් තෝරා ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙන් බැහැරව අමාත්‍යාංශය රු. 1,878,000 ක් මාසික කීම් කුලිය වශයෙන් ෂැංගිරිලා හොටෙල්ස් ලංකා පෞද්ගලික සමාගම වෙත ගෙවීමින් වත් ගෝල්ෆේස් කුළුණගි පවත්වාගෙන යන බවට නිරීක්ෂණය විය.

(සා) සමාලෝචිත වර්ෂය තුළ නොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය, ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය, ශ්‍රී ලංකා ජීව තාක්ෂණික ආයතනය, කාර්මික තාක්ෂණික ආයතනය හා ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව යන ආයතන වෙනුවෙන් ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් ලෙස ගිලිවෙලින් රු.875,354.212 ක් හා රු.986,617,824 බැගින් වැයකර තිබුණ ද, එකී ආයතන වලින් ඉටුකරනු ලබන කාර්යභාරය හා කාර්යසාධනය ඇගයීමකට ලක්කිරීම පිණිස ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීමේ කාර්යභාරය 2021 වර්ෂයේ සිට විගණන දින වූ 2022 මාර්තු 29 දක්වාම ඉටුවී නොතිබුණි.

(සෑ) නැනෝ තාක්ෂණ (පුද්ගලික) සමාගම පර්යේෂණ ව්‍යාපෘති මඟින් සොයා ගත් නව තාක්ෂණයන් ජාතික අවශ්‍යතාවයන් සඳහා සුදුසු පරිදි උපයෝගි කරලීම සඳහාත්, නව සොයා ගැනීම් සඳහා පුළුල් වෙළඳ පොලක් ලබාදීම සඳහාත් රාජ්‍ය මැදිහත්වීම් අමාත්‍යාංශ මට්ටමින් අවශ්‍ය පරිදි සිදුවී නොතිබුණි. ඒ අනුව නව තාක්ෂණයන් තුළින් නව නිපැයුම් සිදුනොවී පර්යේෂණ ප්‍රතිඵල අභාවිත වීමේ හා රටට අහිමි වීමේ අවදානමින් බැහැර විය නොහැකි බව නිරීක්ෂණය විය.

4. මානව සම්පත් කළමනාකරණය

4.1 අනුයුක්තකාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම

සමාලෝචිත වර්ෂයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරුවල පුරප්පාඩු 04 ක් ද, තෘතීයික මට්ටමේ තනතුරුවල පුරප්පාඩු 01 ක් ද, ද්විතියික මට්ටමේ තනතුරුවල පුරප්පාඩු 15 ක් හා ප්‍රාථමික මට්ටමේ තනතුරුවල පුරප්පාඩු 14 ක් පැවතියද අදාළ බඳවා ගැනීම් විගණන දිනය වන 2022 මාර්තු 28 දින වන විටත් සිදුකර නොතිබුණි. ඒ අනුව අමාත්‍යාංශය පිහිටුවා වසරකට අධික කාලයක් ගතවී තිබුණද අමාත්‍යාංශයේ කටයුතු කාර්යක්ෂමව පවත්වා ගැනීමට ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීමට අමාත්‍යාංශය අපොහොසත්වී තිබුණි.

ඩබ්.එම්.යූ.එස්.ඒ විජේකෝන්
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

04 පරිච්ඡේදය – කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

අමාත්‍යාංශය මගින් සෘජුව ක්‍රියාත්මක කරන්නේ ව්‍යාපෘති දෙකක් පමණි. එනම් **තාක්ෂණ ගම්මාන ව්‍යාපෘතිය** සහ ඉලෙක්ට්‍රොනික ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතිය වේ. තාක්ෂණ ගම්මාන ව්‍යාපෘතිය සඳහා සුදුසු භූමිය හඳුනාගැනීම, භූමිය පිළියෙල කිරීම, ඉඩම් අත්කර ගැනීම හා පවරාගැනීම ආදී කටයුතු 2021 වසරේ දී ඉටු කරන ලදී. එබැවින් මෙම සමාලෝචනයට භාජනය වන වසර තුළ විස්තරාත්මක ක්‍රියාත්මක සැලසුමක් සකස් නොවීය. එය භාණ්ඩාගාරය වෙත පූර්ණ අයිතිය ඇති තාක්ෂණ ගම්මාන සංවර්ධන පුද්ගලික සමාගම පිහිටුවීමෙන් පසුව 2022 වසරේ සිට ඉදිරියට සකසා කායී සාධක දර්ශක මත පදනම්ව ක්‍රියාත්මක කිරීමට නියමිතය.

සමාලෝචනයට භාජනය වන කාල පරිච්ඡේදය තුළ බලාපොරොත්තු වූ පරිදි ව්‍යාපෘතිය සඳහා භූමිය හඳුනාගැනීම, මැනීම සහ පිඹුරු පිළියෙල කිරීම, ඉඩම් අත්කරගැනීම හා පවරාගැනීම සහ සැලසුම් හා ව්‍යාපෘති ලේඛන පිළියෙල කිරීම ඉටු කර ගන්නා ලදී.

ඉලෙක්ට්‍රොනික ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතිය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන අතර එය බත්තරමුල්ලේ පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තු පරිසරයේ පිහිටුවා ඇති එම ව්‍යාපෘති කායීාලය සහ ICTA ආයතනය ඒකාබද්ධව ක්‍රියාත්මක කරනු ලැබේ. මෙමගින් ප්‍රථම ඉලෙක්ට්‍රොනික ජාතික හැඳුනුම්පත 2022 වර්ෂයේ තුන්වන කාර්තුවේදී නිකුත් කිරීමට සැලසුම් කර ඇත. එම ඉලෙක්ට්‍රොනික ජාතික හැඳුනුම්පත නිකුත් වීමත් සමග පුද්ගලයන් හඳුනාගැනීම සම්බන්ධයෙන් පවතින අපැහැදිලිතා සහ නොගැලපීම් පිළිබඳ ගැටළු විසඳෙන අතර එය ශ්‍රී ලංකාවේ නීත්‍යානුකූල හා පුළුල් පිළිගැනීමක් සහිත පුද්ගල හඳුනාගැනීමේ මාධ්‍ය බවට පත් වේ.

අමාත්‍යාංශ ලේකම් විසින් මෙම ව්‍යාපෘතියේ කායී සාධනය අධීක්ෂණය කරන අතර එහි සැලසුම්ගත පරිදි අවශ්‍ය සුමට ක්‍රියාකාරීත්වයට අවශ්‍ය මගපෙන්වීම් හා නිවැරදි කිරීම් සිදු කරනු ලැබේ.

05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු:

5.5 b කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා විශේෂයෙන්ම තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය ඇතුළත්ව තාක්ෂණය ලබාගැනීම සඳහා සාධනීය අවස්ථාවන් ලබා දීම.

9.සවිමත් යටිතල පහසුකම් සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කර නව්‍යකරණය දිරි ගැන්වීම.

16.සියලුම ආකාරයේ අල්ලස සහ දූෂණ කැපී පෙනෙන ලෙස අඩු කිරීම.

16.9 උපත් ලියාපදිංචි කිරීම ද ඇතුළුව 2030 වන විට සියලු දෙනාටම නීතිමය අනන්‍යතාවයක් ලබා දීම.

16.10 ජාතික නීති පද්ධතිය සහ අන්තර් ජාතික, ගිවිසුම්වලට අනුකූලව මහජනතාවට තොරතුරු ලබා ගැනීමට ඇති අයිතිය තහවුරු කිරීම සහ මූලික නිදහස ආරක්ෂා කිරීම තහවුරු කිරීම .

17. තිරසාර සංවර්ධනය සඳහා සහයෝගීතාවය ක්‍රියාත්මක කිරීමේ අවස්ථාවන් සවිමත් කිරීම හා පුනර්ජීවනය.

17.7 එකිනෙකා සමගින් සාකච්ඡාවෙන් ඇති කර ගත් එකඟත්වයන් අනුව, වරණීය සහ සහනදායී වාසිදායක කොන්දේසි අනුව, පරිසර හිතකාමී තාක්ෂණයන් සංවර්ධනය වෙමින් පවත්නා රටවල් වෙනුවෙන් සංවර්ධනය කිරීම. එම රටවලට ලබාදීම සහ බෙදාදීම පුවර්ධනය කිරීම.

17.8 2017 වන විට අවම වශයෙන් සංවර්ධනය වී ඇති රටවල් සඳහා තාක්ෂණ බැංකු සහ විද්‍යාව, තාක්ෂණය මහ නවෝත්පාදන ධාරිතාවන් ගොඩනැංවීමේ යාන්ත්‍රණය පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කිරීම සහ විශේෂයෙන් තොරතුරු තාක්ෂණ සහ සන්නිවේදන තාක්ෂණයන්හි නව තාක්ෂණය භාවිතා කිරීම වැඩි දියුණු කිරීම.

අමාත්‍යාංශය හා ඒ යටතේ ක්‍රියාත්මක ආයතන ඉහත සඳහන් අදාළ තිරසාර සංවර්ධන අරමුණු උපරිමයෙන් සාක්ෂාත් කරගැනීම සඳහා කටයුතු කරනු ලබයි. පවත්නා දේශපාලන අස්ථාවරත්වය සහ කලට වේලාවට සම්පත් වෙන් කොට ගැනීමේ අපහසුතා මැද වුවද ඉහත සඳහන් අරමුණු ඉටුකර ගැනීමේ සාර්ථක ප්‍රගතියක් පෙන්නුම් කර ඇත.

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.

I. ජයග්‍රහණ

16.9 උපත් ලියාපදිංචි කිරීම ද ඇතුළුව 2030 වන විට සියලු දෙනාටම නීතිමය අනන්‍යතාවයක් ලබා දීම.

Court Automation මෘදුකාංග පද්ධතිය ස්ථාපිත කිරීමට අදාළ සපුරාගැනීම්.

17. තිරසාර සංවර්ධනය සඳහා සහයෝගීතාවය ක්‍රියාත්මක කිරීමේ අවස්ථාවන් සවිමත් කිරීම හා පුනර්ජීවනය.

විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘති (E-NIC) සියලුම ශ්‍රී ලාංකික පුරවැසියනට තම අනන්‍යතාවය ඉතාමත් නිවැරදිව හා ඉතා කාර්යක්ෂම ලෙස තහවුරු කල හැකි වන පරිදි අනන්‍ය සම ඩිජිටල් හැඳුනුම්පත් (Sri Lanka Unique Digital Identity) නිකුත් කිරීමට **අවශ්‍ය මූලික කටයුතු සම්පාදනය.**

II. අභියෝග

I. දේශපාලන අස්ථාවරභාවය .

II. මුල්‍යයනයේ ඇති අවිනිශ්චිත තත්ත්වයන්

III. තාක්ෂණ උද්‍යාන ස්ථාපනය කිරීමේදී ඇති වී තිබෙන දුෂ්කරතා.

IV. නව අමාත්‍යාංශයක් ලෙස ස්ථාපිත කර ඇති බැවින් පුහුණු හා පළපුරුදු කාර්යයමණ්ඩලයක් නොලැබීම හේතුවෙන් අමාත්‍යාංශයේ කටයුතු විධිමත්ව හා නිසි ආකාරයෙන් සිදු කිරීම දුෂ්කර වී ඇත.

06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

06.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත)**
ජ්‍යෙෂ්ඨ	13	09	04
තෘතීයික	01	-	01
ද්විතියික	30	17	13
ප්‍රාථමික	16	02	14
වෙනත්	01	01	-

06.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟයේ බලපෑම

නව අමාත්‍යාංශයක් ලෙස ස්ථාපිත කර ඇති බැවින් පුහුණු හා පළපුරුදු කාර්යයමණ්ඩලය අනුයුක්ත කර යුතු වුවත් අදාළ බලධාරීන් වෙත කීප වරක් ඉල්ලා ඇත ද අවශ්‍ය මානව සම්පත් නොලැබීම හේතුවෙන් අමාත්‍යාංශයේ කටයුතු විධිමත්ව හා නිසි ආකාරයෙන් සිදු කිරීමට බාධා ඇති වී තිබේ. ක්‍රියාත්මක සැලසුම්කරණය සහ ව්‍යාපෘති ප්‍රගතිය අධීක්ෂණය සඳහා සුදුසුකම් ලත් කාර්ය මණ්ඩලයක් නොමැත. සංවර්ධන අංශයේ බොහෝ රාජකාරීන් ඉටු කරනු ලබන්නේ නව පත්වීම් ලාභී සංවර්ධන නිලධාරීන් දෙදෙනෙකු විසිනි.

06.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	**පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව**	**වැඩ සටහනේ කාල සීමාව**	**සමස්ථ ආයෝජනය (Rs'000)**		**වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය)**	**නිමැවුම/ලබා ගත් දැනුම***
			දේශීය	**විදේශීය**		

කොරෝනා තත්වය හා ඉතාම සීමිත කාර්ය මණ්ඩලයක් පමණක් සිටීම හේතුවෙන් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක නොවුණි.						

07 පරිච්ඡේදය – අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මුල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	**අනුකූල වේ**		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	**අනුකූල වේ**		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	**අනුකූල නොවේ**	අමාත්‍යාංශයට අදාළ නොවේ.	
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	**අනුකූල නොවේ**	අමාත්‍යාංශයට අදාළ නොවේ.	
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	**අනුකූල නොවේ**	අමාත්‍යාංශයට අදාළ නොවේ.	
1.6	වෙනත්	**අනුකූල නොවේ**	අමාත්‍යාංශයට අදාළ නොවේ.	
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	**අනුකූල වේ**		

2.2	පුද්ගල පඩිනඩි ලේඛන/පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	**අනුකූල වේ**		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	**අනුකූල වේ**		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	**අනුකූල වේ**		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	**අනුකූල වේ**		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	**අනුකූල වේ**		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	**අනුකූල වේ**		
2.8	තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	**අනුකූල වේ**		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	**අනුකූල වේ**		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	**අනුකූල වේ**		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීනකර පවත්වාගෙන යාම	**අනුකූල වේ**		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	**අනුකූල වේ**		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	**අනුකූල වේ**		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	**අනුකූල වේ**		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා	**අනුකූල වේ**		

	කිරීමේ දී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම			
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	**අනුකූල වේ**		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	**අනුකූල වේ**		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	**අනුකූල වේ**		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	**අනුකූල වේ**		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	**අනුකූල වේ**		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියලුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම.	**අනුකූල නොවේ**	විගණන විමසුම් ලැබී නොමැත.	
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ.134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	**අනුකූල වේ**		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	**අනුකූල වේ**		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	**අනුකූල වේ**		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	**අනුකූල වේ**		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක්වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	**අනුකූල නොවේ**	අමාත්‍යාංශය භෞතිකව සථාපනය කරනු ලැබුවේ 2021..07.01 දිනය. අභ්‍යන්තර විගණක තනතුරට පත් වූයේ	පසුගිය වසරේ එසේ සිදු නොකළ නමුත් මෙම වසරේ චක්‍රලේඛ වලට අනුකූලව කටයුතු කිරීමට සැලසුම් කිරීම.

			නොවැම්බර් මසයි. එබැවින් කමිටු පිහිටුවීමට නොහැකි විය.	
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	**අනුකූල නොවේ**	අමාත්‍යාංශය අලුතෙන් ස්ථාපනය කරන ලද බැවින් වත්කම් කිසිවක් නොතිබිණි.	
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	**අනුකූල වේ**		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	**අනුකූල වේ**		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	**අනුකූල වේ**		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු 772 .රෙ. අනුව සිදු කිරීම	**අනුකූල වේ**		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	**අනුකූල නොවේ**	අමාත්‍යාංශය සඳහා සංචිත වාහන නැත.	
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	**අනුකූල නොවේ**	අමාත්‍යාංශය සඳහා සංචිත වාහන නැත.	
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම	**අනුකූල නොවේ**	අමාත්‍යාංශය සඳහා සංචිත වාහන නැත.	
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	**අනුකූල නොවේ**	අමාත්‍යාංශය සඳහා සංචිත වාහන නැත.	
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	**අනුකූල නොවේ**	අමාත්‍යාංශය සඳහා සංචිත වාහන නැත.	

9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	**අනුකූල නොවේ**	අමාත්‍යාංශය සඳහා සංචිත වාහන නැත.	
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	**අනුකූල වේ**		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	-		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	**අනුකූල වේ**		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	**අනුකූල වේ**		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එලඹීම	**අනුකූල වේ**		
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ට වලට අනුකූල වීම.	**අනුකූල වේ**		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	**අනුකූල වේ**		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	**අනුකූල වේ**	කල් ඉකුත් වූ තැන්පතු නැත.	
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	**අනුකූල වේ**		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	**අනුකූල වේ**		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	**අනුකූල වේ**		

14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	**අනුකූල වේ**		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	**අනුකූල වේ**		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	**අනුකූල වේ**		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	**අනුකූල නොවේ**	ආදායම් ගිණුමක් නොමැත.	
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	**අනුකූල නොවේ**	ආදායම් ගිණුමක් නොමැත.	
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	**අනුකූල නොවේ**	ආදායම් ගිණුමක් නොමැත.	
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	**අනුකූල වේ**		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	**අනුකූල නොවේ**	ඉතා සීමිත සේවක සංඛ්‍යාවක් සිටීම නිසා නිශ්චිත රාජකාරි පැවරීමක් සිදු කිරීමට අපහසුය.	රාජකාරී ලැයිස්තු පිළියෙල කරමින් පවතී.
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	**අනුකූල නොවේ**	තොරතුරු නිලධාරියෙකු පත් කර නොතිබූ අතර කිසිදු ඉල්ලීමක්ද ඉදිරිපත් නොවුණි.	
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	**අනුකූල නොවේ**	කාර්ය මණ්ඩලය සුළු ප්‍රමාණයක් පමණක් සිටීම.	මෙම වසරේදී තොරතුරු නිලධාරියෙකු පත් කිරීමට කටයුතු කරනු ඇත.
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ	**අනුකූල නොවේ**	අමාත්‍යාංශයට අදාල සමජ මාධ්‍ය ජාලාවල මහජනයාගේ	මෙම වසර තුලදී මහජන ප්‍රතිචාර එක් කිරීමට හැකි

	ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම		ප්‍රශංසා/චෝදනා පලකිරීමට පහසුකම් සලසා ඇත	වන පරිදි වෙබ් අඩවිය සැකසෙමින් පවතී.
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	**අනුකූල නොවේ**	තොරතුරු නිලධාරියෙකු පත් කර නොතිබූ අතර කිසිදු ඉල්ලීමක්ද ඉදිරිපත් නොවුණි.	
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	**අනුකූල නොවේ**	කාර්ය මණ්ඩලය සුළු ප්‍රමාණයක් පමණක් සිටීම.	මෙම වසරේදී තොරතුරු නිලධාරියෙකු පත් කිරීමට කටයුතු කරනු ඇත
18.2	රාජ්‍ය අමාත්‍යාංශයේ 05/2008 සහ 05/2018(1) චක්‍රලේඛය ප්‍රකාරව පුරවැසි ප්‍රඥප්තියක්/ පුරවැසි සේවාලාභියාගේ ප්‍රඥප්තිය ආයතනය විසින් සකස් කර ක්‍රියාත්මක කර ඇත. පරිපාලනය සහ කළමනාකරණය	**අනුකූල නොවේ**	කාර්ය මණ්ඩලය සුළු ප්‍රමාණයක් පමණක් සිටීම.	මෙම වසරේදී තොරතුරු නිලධාරියෙකු පත් කිරීමට කටයුතු කරනු ඇත
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	**අනුකූල වේ**		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකටම අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	**අනුකූල නොවේ**	කාර්ය මණ්ඩලය සුළු ප්‍රමාණයක් පමණක් සිටීම.	මෙම වසරේදී තොරතුරු නිලධාරියෙකු පත් කිරීමට කටයුතු කරනු ඇත
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ අංක 01හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	**අනුකූල වේ**		

19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම.	**අනුකූල නොවේ**	කාර්ය මණ්ඩලය සුළු අමාත්‍යාංශයට අධාල සමජ මාධ්‍ය ජාලාවල මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පලකිරීමට පහසුකම් සලසා ඇත ප්‍රමාණයක් පමණක් සිටීම.	මෙම වසරේදී තොරතුරු නිලධාරියෙකු පත් කිරීමට කටයුතු කරනු ඇත
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	**අනුකූල වේ**		